# සංසාරය හා කර්මය

ප්‍රත්‍යක්ෂ යන්නට අයත්වන්නේ මනස ද ඇතුළු ඉන්ද්‍රියවලට ගෝචරවන වත්මන් අත්දැකීම් ය. බුදුන් වහන්සේ ධර්මය ද ප්‍රත්‍යක්ෂයෙන් දැනගැනීමට යැයි දේශනා කෙළේ ය. එපමණක් නොව නිවන ද ප්‍රත්‍යක්ෂය කළ යුතු බැව් කියැවෙයි. එහෙත් නිවන ප්‍රත්‍යක්ෂ කරන්නේ මනසින් ද යන ප්‍රශ්නය අප හමුවේ වෙයි. මනසින් නිවන ප්‍රත්‍යක්ෂ කිරීමට නම් මනස "පැවතිය" යුතු ය. එහෙත් මනස එසේ පවතීය යන්නෙහි තේරුම මම හා මම පිළිබඳ මතකය ආදිය ගැන තවදුරටත් විශ්වාසය තබා ගැනීම ය. මම යන්න ගැන විශ්වාසයක් තබා ගැනීම යනු මම පැවතීම ය. එහෙත් එලෙස මම ඇත්නම් තණ්හාව පවතියි. එවිට නිවන් ප්‍රත්‍යක්ෂ වීම යන්න අර්ථ ශුන්‍ය වූවක් බවට පත්වෙයි.

නිවන ප්‍රත්‍යක්ෂය, හා සාමාන්‍ය දේ ප්‍රත්‍යක්ෂය එකම යැයි ගැනීම වැරදි යැයි සිතමි. ඒ එකම නම් අප බොහෝ දෙනකුට නිවන් ප්‍රත්‍යක්ෂ කරගැනීමේ අමාරුවක් තිබිය නොහැකි ය. නිවන් ප්‍රත්‍යක්ෂය ගැන කතා කළ ද ඒ ප්‍රත්‍යක්ෂය යනු මනසක් නැති බව ප්‍රත්‍යක්ෂ කර ගැනීම ය. මනසක් ඇතැයි යනුවෙන් ගැනීම ම වරදකි. එසේ නම් මනසක් නැතැයි ගැනීම නිවැරදි ද? මනසක් නැතැයි කී විට මනසක් තිබීමට ද හැකියාවක් වෙයි. නැති මනස ඇති මනසක් ලෙස, එනම් මනසක් ඇතැයි යනුවෙන් ගැනීමක් මනස ගැන කතා කිරීමේ දී සිදු වෙයි. එබැවින් මෙහි දී මනසක් නැතැයි කීමට වඩා නැති මනස ගැන කතා කිරීම උචිත වෙයි. එහෙත් සාමාන්‍ය ව්‍යවහාරයේ දී මනසක් නැතැයි කීම බරපතළ වරදක් යැයි නොසිතමි. එය ආත්මයක් නැතැයි කීම මෙනි. ආත්මයක් නැතැයි කී විට ආත්මයක් තිබීමට ද හැකි කමක් වෙයි. එබැවින් එහි දී ද ඉහත දැක් වූ අයුරින් නැති ආත්මයක් ඇතැයි ගැනීමක් සිදු වෙයි. අප කළ යුත්තේ ආත්මයක් නැතැයි කීමට වඩා නැති ආත්මයක් ගැන කතා කිරීම ය.

කෙසේ වෙතත් නිවන් ප්‍රත්‍යක්ෂයෙහි දී නැති ආත්මය ඇති ආත්මයක් නොව නැති ආත්මයක් බවත් නැති මනස ඇති මනසක් නොව නැති මනසක් ලෙස ප්‍රත්‍යක්ෂ කිරීමත් සිදු වන්නේ යැයි සිතිය හැකි ය. එහෙත් එහි දී ප්‍රශ්නය වනුයේ නැති මනස නැති මනසක් බව ප්‍රත්‍යක්ෂ කරන්නේ කෙසේ ද යන්න ය. නැති මනස නැති මනසක් බව මනසින් ප්‍රත්‍යක්ෂ කිරීමක් මෙහි දී සිදුවිය නොහැකි ය. එසේ මනසින් ප්‍රත්‍යක්ෂ කළහොත් එහි දී මනස ඇති බව ගැනෙයි. මේ තත්ත්වයෙන් ගොඩ ආ හැක්කේ නිවන් ප්‍රත්‍යක්ෂ කිරීම යනු නැති මනස නැති මනසක් බව නැති මනසින් ගැනීම යනුවෙන් සැලකීමෙනි. එහෙත් ඒ කුමක්දැයි වචනයෙන් කිව හැකි යැයි සිතිය නොහැකි ය. නිවන ගැන කතා කිරීමේ දී ද ප්‍රත්‍යක්ෂය යන වචනය යොදා ගත්ත ද එය සාමාන්‍යයෙන් දන්නා ප්‍රත්‍යක්ෂයක් නොවේ. ඒ නිවන් ප්‍රත්‍යක්ෂය කුමක්දැයි වචනයෙන් විස්තර කිරීමට නොහැකි බැවින් නිවන සම්බන්ධයෙන් ද අපි ප්‍රත්‍යක්ෂය යන්න යොදා ගනිමු.

අපේ සාමාන්‍ය ප්‍රත්‍යක්ෂවලින් වෙන්වන තවත් ප්‍රත්‍යක්ෂ ද වෙයි. ඒ අභිඥා ය. වචනයේ තේරුම අනුව ම එහි දී අභිඥානයක් ලබා ගැනෙයි. අභිඥා පහක් වෙයි. දිබ්බචක්ඛු හෙවත් දිවැස, දිබ්බසොත හෙවත් දිවකණ ආදී වශයෙන් පංචාභිඥා හැඳින්වෙයි. අපට සාමාන්‍යයෙන් නොපෙනන දේ දිවැසින් දැකි ය හැකි ය. දිවැසින් දැකීම යනු ද ප්‍රත්‍යක්ෂයකි. එලෙස දිවැසින් දැකීම ද වර්තමානයෙහි, ඒ මොහොතේ සිදු වෙයි. බෞද්ධයෝ මේ ප්‍රත්‍යක්ෂ ද අත් නොහරිති. පංචාභිඥා සියළු දෙනාට ඇතැයි නොකීව ද අවශ්‍ය අයකුට ඒ ලබා ගැනීමේ හැකියාව වෙයි. ඒ සඳහා අවශ්‍ය යෝග අභ්‍යාසවල යෙදීම, භාවනා කිරීම, ධ්‍යාන උපදවා ගැනීම ආදී ක්‍රමවලින් යමකුට පංචාභිඥා ලබාගත හැකි ය. ඒ පංචාභිඥා මගින් ලබාගන්නා ප්‍රත්‍යක්ෂ හා දැනුම ද අනෙක් දැනුම් මෙන් ම දැනුම් විශේෂයක් වෙයි.

එහෙත් එලෙස දැනුම් ලබා ගැනීම නිවන් ප්‍රත්‍යක්ෂයට පහසුවන්නේ යැයි සිතිය නොයුතු ය. පංචාභිඥා මගින් ලබාගන්නා ප්‍රත්‍යක්ෂ හා දැනුම ද මනස ආධාර කරගෙන පවතියි. එහි දී ද මනස ප්‍රධාන වෙයි. නැති මනස ඇති මනසක් ලෙස ගැනීම එහි දී සිදුවෙයි. ඇතැම් විට ඇතැම් අයකු එවැනි දැනුම් ලබා ගැනීම හේතුවෙන් නිවනෙන් තව තවත් ඈත්වනවා විය හැකි ය. එයට හේතුව එවැනි දැනුම් මගින් "මම" ගැන ආඩම්බරයක්, ගර්වයක් ඇති වීමට ඉඩ තිබීම ය. තමාට පංචාභිඥා ඇතැයි යමකු උඩඟුවන්නේ නම් ඒ පුද්ගලයාට නිවන් ප්‍රත්‍යක්ෂය තවත් අමාරු වෙයි. මෙහි තේරුම පංචාභිඥා උපදවා ගැනීම නිවනට බාධාවක් ය යන්න නොවේ. පෙර ආත්ම දැන ගැනීමේ ක්‍රමයක් අපට වේ නම් එමගින් සසරෙහි නිස්සාරබව ගැන අපට තවත් අවබෝධ වීමට ද ඉඩ ඇත. එහෙත් එය අනෙක් අතට ද

© Prof. Nalin De Silva

ක්‍රියාත්මක වීමට ඉඩ ඇත. අහවල් අහවල් අභිඥා ඇත යන හැඟීම හරහා යමකුට ආත්මය පිළිබඳ හැඟීම වර්ධනය වීමට ද ඉඩ ඇත.
ඒ කෙසේ වුවත් පංචාභිඥා මගින් ද ලබාගන්නේ, එනම් නිර්මාණය කරන්නේ දැනුමකි. එය ද අනුමානයෙන් හෝ තර්කයෙන් හෝ ලබාගන්නා දැනුමක් නොව ප්‍රත්‍යක්ෂයෙන් ලබා ගන්නා දැනුමකි. මෙවැනි දැනුම් ගැන වෙනත් සංස්කෘතීන් හි ද කියැවුණ ද, ඒ දැනුම් ලබාගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් තිබී ඇත්තේ ප්‍රාග් වෛදික භාරතීය සමාජයෙහි බව පෙනී යයි. ධ්‍යාන ඉපදවීම, ධ්‍යානයට සම වැදීම ඒ සඳහා භාවනා කිරීම ආදිය ක්‍රමවත් ව කළෝ භාරතීයයෝ ය. ඒ නිසා හෝ වෙනත් කරුණක් නිසා හෝ ප්‍රාග් වෛදික භාරතීයයනට සංසාරය යන්න පිළිබඳ වෙනත් සංස්කෘතියක ජීවත්වූවන්ට නොවූ ආකාරයේ දැනුමක් විය. ධ්‍යාන මගින් හෝ වෙනත් ක්‍රමයකින් හෝ සත්ත්වයා සසර සැරිසරන බව දැනගැනීමට ඔවුන්ට හැකියාවක් තිබුණි. පසුව පැමිණි ආර්යයන්ට ද මේ සම්ප්‍රදාය යම් ප්‍රමාණයකට හෝ උරුම විය. ඍෂිවරු යනු ප්‍රාග් වෛදික ධ්‍යාන ක්‍රම ආර්ය සංස්කෘතියට අවශෝෂණය කරගැනීමේ ප්‍රතිඵලයක් ලෙස බිහි වූවන් යැයි සිතිය හැකි ය. මේ ඍෂිවරුන්ට ද තුන්කල් දැකිය හැකි විය. ආයුර්වේදය වැනි වෛද්‍ය ශාස්ත්‍රයක් (විද්‍යාවක්) ගොඩනගනු ලැබුයේ මේ ඍෂිවරුන් විසින් යැයි කියනු ලැබේ.

එහෙත් වෛදිකයන් පසු කලෙක දැනුම ලබාගැනීමේ දී ධ්‍යාන ක්‍රමවලින් වෙනත් ක්‍රමවලට ගොස් ඇති බව පෙනෙයි. ප්‍රත්‍යක්ෂයෙන් ලබා නොගත් පොත පතේ දැනුම ද ඇතුළු මේ දැනුම් හා දැනුම ලබාගැනීමේ ක්‍රම ප්‍රාග් වෛදික සම්ප්‍රදායේ වූවන් විසින් අවඥාවෙන් බැහැර කරනු ලැබ ඇති බව පෙනෙයි. ඔවුහු මේ ක්‍රමවලට අධ්‍යයන, එනම් ධ්‍යාන නොවන්න යැයි කීවෝ ය. ප්‍රාග් වෛදිකයන්ට වැදගත් වී ඇත්තේ ධ්‍යාන ය. එබැවින් ඔවුන්ගේ සම්මත හෙවත් පිළිගත් ක්‍රමය වූයේ ධ්‍යාන ය. අද අප ගෞරවයෙන් සැලකුව ද අධ්‍යයනය යන්න, එසේ ධ්‍යාන නොවන ලෙස, ප්‍රාග් වෛදිකයන් විසින් අවඥාවෙන් බැහැර කරනු ලැබුවකි.

අපේ ප්‍රවාදයෙහි අපට වැදගත් වන්නේ සංසාරය යන්න ප්‍රත්‍යක්ෂයෙන් ලබාගත් දැනුමක් වේය යන්න ය. එය ප්‍රාග් වෛදිකයන්ගේ දැනුමක් විය. සංසාරය යන්න සියළු දෙනාට කෙසේ වෙතත් ධ්‍යාන ලැබූ ඇතැමුන්ට ප්‍රත්‍යක්ෂයෙන් දැනගත හැකි වූවක් විය. එයට ප්‍රවාදයක් අවශ්‍ය නොවී ය. බොහේ විට කර්මය යන වියුක්ත ප්‍රවාදය වෛදික ඍෂිවරුන් විසින් එකතු කරනු ලැබුවක් විය හැකි ය. කර්මය යන්න ප්‍රත්‍යක්ෂයෙන් දත හැක්කක් නොවේ. පොල් ගෙඩියක් පොළවට වැටීම ප්‍රත්‍යක්ෂයෙන් දැනගත හැකි වුව ද, ගුරුත්වාකර්ෂණය ප්‍රත්‍යක්ෂයෙන් දැන ගත හැකි වූවක් නොවේ. ගුරුත්වාකරෘණය යනු නිව්ටන් විද්වතා විසින් නිර්මාණය කරනු ලැබූ වියුක්ත ප්‍රවාදයකි. කර්මය ද එවැනි වියුක්ත ප්‍රවාදයකි. පොල් ගෙඩි වැටීම ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය ඇසුරෙන් තේරුම් ගන්නා ආකාරයට සංසාරයේ සැරිසැරීම කර්මය නම් වියුක්ත ප්‍රවාදය ඇසුරෙන් තේරුම් ගනු ලැබෙයි. එකල භාරතයේ වියුක්ත ප්‍රවාද ගොඩනැගුවෝ වෛදිකයෝ (ආර්ය සංස්කෘතියට ප්‍රාග් වෛදික සංස්කෘතිය අවශෝෂණයෙන් අළුත් සංස්කෘතියක් නිර්මාණය කළෝ) වූහ. ප්‍රාග් වෛදික භාරතීයයන් වියුක්ත ප්‍රවාද ගොඩනැගී යැයි සිතිය නොහැකි ය.

මෙය තවදුරටත් පැහැදිලි කළ යුතු ය. කර්මය හා සංසාරය එකට ගැනීමට අද අප පුරුදු වී සිටිය ද, ඈත අතීතයේ දී එය එසේ නොවීය යන්න මගේ අදහස වෙයි. ඒ සඳහා මට ඇති සාක්ෂි කවරේදැයි කිසිවකු ඇසීමට ඉඩ ඇත. මට ඒ සඳහා ඍජු සාක්ෂියක් නැත. මට ඇත්තේ මා විසින් ගොඩනගන ලද ප්‍රවාදයක් පමණකි. ඒ ප්‍රවාදය චින්තනය හා සම්බන්ධ වෙයි. ඒ ප්‍රවාදයට අනුව භාරතීය ප්‍රාග් වෛදික සංස්කෘතිය ද ඇතුළු ආසියාතික සංස්කෘතීන් සංයුක්ත සංස්කෘතීන් වෙයි. ඔවුන්ගේ දැනුම ප්‍රත්‍යක්ෂයෙන් ලබාගත් අතර ඔවුන්ට ප්‍රවාද තිබී නම් ඒ සංයුක්ත ප්‍රවාද විය. කිසිම දැනුමක් සංකල්ප නොමැතිව ලබාගත නොහැකි බව අමුතුවෙන් කිවයුතු නොවේ. සංසාරය යන්න ද සංකල්පයකි. එහෙත් එය ඇතැම් ධ්‍යානලාභීන්ට ප්‍රත්‍යක්ෂයෙන් දැනගත හැකි සංයුක්ත සංකල්පයක් විය. යම් අයකුට අවශ්‍ය නම් අවශ්‍ය භාවනා ප්‍රගුණ කිරීමෙන් සංසාරය ප්‍රත්‍යක්ෂ කර ගත හැකි විය.

මා විසින් ගොඩනගා ඇති ප්‍රවාදයට අනුව භාරතයට පැමිණි ආර්යයෝ නව සංස්කෘතියක් ඇති කළහ. බටහිරින් භාරතයට ආර්යයන් පැමිණියේ ම වියුක්ත චින්තනයක් සහිතව ය. ඔවුන් විසින් භාරතයේ එවකට තිබූ සංස්කෘතියෙහි ඇතැම් දෑ ද අඩංගු කරගනිමින් නිර්මාණය කරනු ලැබූ නව සංස්කෘතිය යම් ප්‍රමාණයකට වියුක්ත චින්තනයක් මත පදනම් විය. ඒ වියුක්ත චින්තනය මත පදනම් ව ඔවුහු වියුක්ත ප්‍රවාද ද නිර්මානය කළහ. කර්මය යනු එවැනි වියුක්ත ප්‍රවාදයකි. පසුව ඒ ප්‍රවාදය ප්‍රාග් වෛදික සංස්කෘතිය විසින් ද යොදා ගනු ලැබිණි. මගේ ප්‍රවාදය සංගත

© Prof. Nalin De Silva

වෙයි. එමගින් මට යම් යම් කරුණු අවබෝධ කරගත හැකි වෙයි. එනම් ඒ කරුණු ප්‍රවාදය මගින් විස්තර කිරීමට හැකි වෙයි. එපමණට ප්‍රවාදය මට වැදගත් වෙයි. චින්තනය යන සංකල්පය අප බොහෝ දෙනකු සිතනවාට වඩා ප්‍රබල සංකල්පයක වෙයි. මගේ ප්‍රවාදය සංගත වීම හා කරුණු තේරුම් ගැනීමට උපකාරී වීම මෙහි දී වැදගත් වෙයි. ඕනෑම ප්‍රවාදයක් විසින් අවසානයේ දී කෙරෙණුයේ දැනුමට යමක් එකතු කිරීම ය. වියුක්ත ප්‍රවාදයකින් යම් යම් ප්‍රපංච (phenomena) තේරුම් කර දෙයි. ඒ ප්‍රත්‍යක්‍ෂයෙන් දැන ගත හැක්කක් නොවේ.

මිනිසුන් හා අනෙක් සත්ත්වයන් සසර සැරිසරන්නේ ඇයි ද යන ප්‍රශ්නයට පිළිතුරක් නිර්මාණය කරන්නට ඇත්තේ වෛදිකයන් යන්න මගේ ප්‍රවාදයෙහි වෙයි. ඔවුන් නිර්මානය කළ පිළිතුර අන් කිසිවක් නොව කර්මය වෙයි. කර්මය යන වියුක්ත ප්‍රවාදය නිර්මාණය කළ වෛදිකයෝ එය වෛදික ආගම්වලට ද එකතු කර ගත්හ. සිදුහත් කුමරු ඉපදෙන කාලය වන විට කර්මය යන ප්‍රවාදය ඊසාන දිග භාරතයට ද (නේපාලය ද ඇතුළුව) ව්‍යාප්ත වී තිබූ බව පැහැදිලි ය. වෛදිකයන් වත්මන් බටහිරයන් පමණට ම වියුක්ත ප්‍රවාදකරණයෙහි ශූරයන් නොවුන ද ඔවුන්ට ඒ සඳහා විශාල හැකියාවක් විය. ඒ නිසාම ඔවුහු වැඩිකල් නොගොස් ම අනෙක් ආසියාතිකයන්ගෙන් වෙන්වූහ. ඉහත සඳහන් ආකාරයට ම ආයුර්වේදය ද වෛදිකයන්ගේ නිර්මාණයක් විය. වියුක්ත චින්තනයකට හිමිකම් කී භාරතීය වෛදිකයන්ට අනෙක් ආසියාතිකයන්ට මෙන් නොව වියුක්ත ප්‍රවාද ගොඩනගා ගැනීමේ හැකියාව විය. මේ සම්ප්‍රදාය විශාල වශයෙන් පසුකාලීන මහායාන බුද්ධාගමෙහි ද දැකිය හැකි ය. ථෙරවාද බුද්ධාගමෙහි ද අභිධර්මයෙහි දක්නට ලැබෙන්නේ මේ සම්ප්‍රදාය ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva